# ෆොන්සේකා හා ෆොන්සේකා

මහානායක හිමිවරුන් ප්‍රධාන පිරිසක් සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගැනීම පිළිබඳ විරුද්ධ වෙති. මෙහි දී ජ වි පෙරමුණේ විරුද්ධතාව සැළකිල්ලට ගත නොහැකි ය. විප්ලවය අත ළඟ යැයි සිතා සිටින සෝමහංස පිල්මාට් අමරසිංහ ඇතුලු නායකයන් තමන් විසින් ලිප්ටන් වටරවුමට කැඳවනු ලැබූ තම සාමාජිකයන්ගේ සංඛ්‍යාවෙන් (සාමාජිකයන්ගෙන් අති විශාල බහුතරය එහි සිටි බව රහසක් නො වේ) ස්වයං මෝහනයට පත්ව ආණ්ඩුවට හා විවිධ පුද්ගලයන්ට පුහු අභියෝග එල්ල කෙළේ අසික්කිත වචන යොදා ගනිමිනි. වෛරය හා වෛරය පමණක් මත පදනම් වූ ජ වි පෙ දේශපාලනය තව තවත් වෛරය දෙසට ම තල්ලු කිරීම සෝමහංසලාගේ අභිප්‍රාය වී ඇති බව පැහැදිලි ය. හිටපු ජෙනරාල් සරත් ෆොන්සේකා සමග එකතු වී එ ජා පෙරමුණට හංසයා නොව කොකා පෙන්වා විප්ලව කිරීමට දත මැදගෙන සිටි ජ වි පෙ අද දේශපාලනයෙහි නන්නත්තාර වී ජෙනරාල් සොයයි. ඔවුන්ට දැන් ජෙනරාල් අවශ්‍ය වන්නේ පාර්ලිමේන්තු මහාමැතිවරණයට ඉදිරිපත් වීමට නායකයකු අවශ්‍ය නිසා ය. සරත් ෆොන්සේකා අත් අඩංගුවට ගැනීම ජ වි පෙට විඳ දරාගත නොහැක්කේ එබැවිනි. අද ජ වි පෙට අනෝමා ෆොන්සේකාගේ ම පිහිට ය. එහෙත් ඇගේ නායකත්වයෙන් වුවත් එ ජා පක්ෂයෙහි සහාය නොමැතිව මැතිවරණයට ඉදිරිපත් වුවහොත් ජ වි පෙට දිනාගත හැකි පාර්ලිමේන්තු අසුනක් පේදුරුතුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා නැති බව වඩාත්ම දන්නේ දැන් නොයෙකුත් රංගනවල යෙදෙන සෝමහංස - අනුර දිසානායක නම් ඇමරිකන් හිතවාදී නායකත්වය ය.

මහානායක හිමිවරුන් තවමත් ඉල්ලා සිටින්නේ විරුද්ධ පක්ෂයෙන් ජනාධිපතිවරණයට තරග කළ සරත් ෆොන්සේකා සියලු චෝදනාවලින් නිදහස් කරන ලෙස ය. උන්වහන්සේලාට අනුව සරත් ෆොන්සේකා ජනාධිපතිවරණයේ දී කරන ලද ඇතැම් ප්‍රකාශ පදනම් කරගනිමින් සරත් ෆොන්සේකා අත් අඩංගුවට ගෙන ඇත. එ නොමනා ක්‍රියාවක් බව උන්වහන්සේලාගේ අදහස ය. මෙහි දී ප්‍රශ්නය වී ඇත්තේ මේ ප්‍රකාශ කවරේදැයි උන්වහන්සේලා විසින් වදාරණු නො ලැබීම ය. මේ ප්‍රකාශ කලවැද්දා පාහරයා ආදිය යැයි අපි මොහොතකටවත් නො සිතමු. ජනාධිපතිවරණයක දී එවැනි ප්‍රකාශ කළ පමණින් හමුදා පොලීසිය ෆොන්සේකා අත් අඩංගුවට ගත්තේ යැයි සිතිය නො හැකි ය. ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමට හේතු වූ සියලු කරුණු අපි නො දනිමු. මහානාහිමිවරුන් ද එ දන්නා බවක් නො පෙනෙයි. එහෙත් මෙහි දී තවත් කරුණක් අවධාරණය කළ යුතු ය. සරත් ෆොන්සේකා ජනාධිපතිවරණයේ දී කළ ඇතැම් ප්‍රකාශයක් ඔහු හමුදාවේ දී ලද යම් අත්දැකීමක් හෝ ඇසූ ඕපදූපයක් හෝ පදනම් කරගෙන විය හැකි ය. එවිට එ ප්‍රකාශය ජනාධිපතිවරණයෙහි දී කළත් එ හමුදාවේ සිටිය දී කරන ලද, අසන ලද දේ මත පදනම් වෙයි. එවැනි අවස්ථාවක ප්‍රකාශය කෙරෙන්නේ හමුදාවේ සේවය කිරීමේ දී දැනගත් සත්‍ය හෝ අසත්‍ය කරුණු මත පදනම් ව බැවින් එ හමුදා සේවය සමග බැඳෙයි.

මහානායක හිමිවරුන් පසුපස ගොස් සංඝභේදය ඇතිකිරීමට ක්‍රියාකළ රනිල් අද පසුබැස ඇත. ඔහු එහි දී කරු ජයසූරිය උපාසකතැන යොදාගත්තේ ය. බටහිරයන්ගේ උපදෙස් මත ක්‍රියාකරන මෙරට සංස්කෘතියට ආගන්තුක රනිල් අදත් උත්සාහකරන්නේ ෆොන්සේකා තවත් අවුංසාන් සූකී කෙනකු කිරීමට ය. එ සඳහා මියන්මාරයේ මෙන් ෆොන්සේකා වෙනුවෙන් මහානායක හිමිවරුන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේ යොදාගැනීමට බටහිරයෝ බලාපොරොත්තු වූහ. පසුගිය බ්‍රහස්පතින්දා දළදා මාළිගාව අබියස ඊනියා සංඝ සම්මේලනයක් සංවිධානය කිරීමට කටයුතු කර තිබුණේ එ අනුව ය. එහෙත් ලංකාවේ සිංහල බෞද්ධ දේශපාලනය සමග හැරෙන්නටවත් රනිල්ට හා ඔහුගේ බටහිර ස්වාමිවරුන්ට නො හැකි ය. අද රනිල් සංඝ භේදය ඇතිකිරීමක් හා සිංහලයන් භේදකිරීමක් ගැන ආණ්ඩුවට දොස් පවරන්නේ ගලේ පැහැරූ බළලකු සිහිගන්වමිනි. ෆොන්සේකා යොදාගෙන සිංහලයන් භේදකිරීමට උත්සාහ ගත්තෝ බටහිර ඒජන්තයන් වූ රනිල්, අනුර දිසානායක, මංගල වැන්නෝ ය. රනිල් රවි ආදී පිරිස් කරු ජයසූරිය වැන්නන් යොදාගනිමින් කරන දේශපාලනයෙන් බටහිරයන්ගේ ආධාරයෙන් එ ජා ප නායකත්වය රැකගනු ඇත. එහෙත් ඔවුන්ට රටේ නායකත්වය ලබාගැනීමට උපකාරි වීමට කරු ජයසූරියට හෝ වෙනත් උපාසකයකුට හෝ නො හැකි ය. අද අපට අපේම වූ දේශපාලන ප්‍රවාද ඇති බව මොවුන් සිහිතබාගත යුතු ය. කෙසේ වෙතත් මහානායක හිමිවරුන් ජනාධිපතිවරණ ව්‍යාපාරයෙහි යෙදී සිටි කාලයෙහි දී ෆොන්සේකා ගෙන්වා සිංහලයන් භේද නොකරන ලෙසටත් සුදුකොඩි වැනි අභූත චෝදනා නෙනගන ලෙසටත් අනුශාසනා කෙළේ නම් උන්වහන්සේ පෙර රජ දවස මෙරට වැඩ සිටි මහතෙරුන් වහන්සේලා අනුදැන වදාළ මාර්ගය ගත්තේ යැයි අපට සාධුකාර දීමට තිබිණි.

© Prof. Nalin De Silva

රනිල් ඇතුලු එ ජා ප නායකයන් කියන්නේ විපක්‍ෂයේ ජනාධිපති අපේක්‍ෂකයා අත්අඩංගුවට ගැනීම ප්‍රජාතන්ත්‍ර විරෝධී බව ය. හමුදා පොලීසිය අත්අඩංගුවට ගෙන ඇත්තේ විපක්‍ෂයේ ජනාධිපති අපේක්‍ෂක ෆොන්සේකා නම් රනිල්ගේ මේ ප්‍රකාශය නිවැරදි ය. එහෙත් හමුදා පොලීසිය අත්අඩංගුවට ගෙන ඇත්තේ හිටපු හමුදාපති හා හිටපු ආරක්‍ෂක නිලධාරීන්ගේ ප්‍රධානියා නම් හා එසේ අත්අඩංගුවට ගැනීමට හමුදාමය හේතු තිබිණි නම් රනිල්ගේ ප්‍රකාශය තවත් රනිල් ප්‍රකාශයක් පමණක් බවට පත්වෙයි. එයින් අත්වන එකම ප්‍රතිඵලය මැතිවරණයේ දී රනිල් වික්‍රමසිංහට හා පක්‍ෂයට තවත් අසාමාන්‍ය පරාජයක් ලැබීම ය. ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමට ප්‍රධාන හේතුවක් ලෙස අපට  පෙනී යන්නේ අන් කිසිවක් නොව ඊනියා සුද්දකොඩි ප්‍රකාශය ය. ඒ ප්‍රකාශය ඔහු කර ඇත්තේ හිටපු හමුදාපති ලෙස හා හිටපු ආරක්‍ෂක නිලධාරීන්ගේ ප්‍රධානියා ලෙස අත්කරගත් දැනුම හා ඕපාදූප මත පදනම් වී බැවින් ඔහු අත්අඩංගුවට ගැනීමට හමුදා පොලීසියට හමුදා පනත යටතේ බලතල ඇති බව අප දැනගත යුතු ය. හමුදා අධිකරණයට ඔහු ඉදිරිපත් කළ යුතු ද නැත් ද යන්න වත්මන් හමුදාපතිවරයා යථා කාලයේ දී තීරණය කරනු ඇත. එහෙත් ෆොන්සේකා යුද්ධාධිකරණය හමුවට පැමිණ විය යුතු යැයි අප කියා සිටියේ පසුගිය දෙසැම්බරයේ දී ය. ඔහු වෙන කිසිවක් නැතත් සුද්ද කොඩි ප්‍රකාශයෙන් රාජද්‍රෝහි, ජාතිද්‍රෝහි, හමුදාද්‍රෝහි වී ඇතැයි අපි නිගමනය කෙළෙමු. සුද්ද කොඩි ගැන අප ගිය සතියේ ද විස්තරයක් කළ බැවින් ඒ නැවත සඳහන්කිරීමට නො වෙහෙසෙමු.

හමුදා පොලීසිය අත්අඩංගුවට ගෙන ඇත්තේ සුද්ද කොඩි හා වෙනත් ප්‍රකාශ කළ එමෙන් ම ඇතැම්විට හමුදා විනයට පටහැණි වෙනත් ක්‍රියාවල යෙදුණු හිටපු හමුදාපති හා හිටපු ආරක්‍ෂක නිලධාරී ප්‍රධාන ෆොන්සේකා ය. ඒ බව හුදු දේශපාලන වාසි සඳහා කරුණු විකෘත කරන රනිල් - සෝමහංස - මංගල හවුලට (අවුලට) හැරෙන්නට අනෙක් අයට පැහැදිලි ය. රනිල් සෝමහංස අවුල කියන්නේ ජනාධිපති අපේක්‍ෂක ෆොන්සේකා අත්අඩංගුවට ගෙන ඇති බව ය. මෙහි ෆොන්සේකාලා දෙදෙනකු ගැන කියැවෙයි. ප්‍රශ්නය වී ඇත්තේ තම රටවල රාජ්‍යය අධ්‍යාපනය ආදිය ආගමෙන් වෙන්කෙරී ඇතැයි බෙරිහන් දෙන බටහිර යටත්විජිතවාදීන්ට වුව ද මේ ෆොන්සේකාලා දෙදෙනා වෙන්කිරීමට නොහැකිවීම ය. හිටපු හමුදා නිලධාරී ෆොන්සේකා අත්අඩංගුවට ගෙන ජනාධිපතිවරණයේ විරුද්ධ පක්‍ෂ අපේක්‍ෂකයා ගෙදර තබා යෑමට හැකි පරිදි ෆොන්සේකාලා දෙදෙනා වෙන්කිරීමේ ක්‍රමයක් බටහිරයන් කියා දී තිබිණි නම් එවිට හමුදා පොලීසියට ජනාධිපති අපේක්‍ෂකයා ගෙදර තබා යෑමට තිබිණි. දැන් වුවත් රනිල්ට බටහිරයන්ගෙන් අසාගෙනවත් එවැනි වෙන්කිරීමේ ක්‍රමයක් ගැන කීමට හැකිනම් හමුදා පොලීසිය හිටපු හමුදාපති ෆොන්සේකා රඳවාගෙන ජනාධිපති අපේක්‍ෂක ෆොන්සේකා ගෙදර එවනු ඇත. වෙන්කිරීම ගැන තෙපරබාන බටහිර පඬියන්ට ෆොන්සේකාලා වෙන්කිරීමට නොහැකි බැවින් රනිල් ආදීහු එහි දේශපාලන වාසිය ගැනීමට ආණ්ඩුව විරුද්ධ පක්‍ෂයේ ජනාධිපති අපේක්‍ෂයා අත්අඩංගුවට ගෙන ඇතැයි  කියමින් රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැතිවීමක් ගැන බෙරිහන් දෙති.

හමුදා පොලීසිය විරුද්ධ පක්‍ෂයේ අපේක්‍ෂක ෆොන්සේකා අත්අඩංගුවට ගන්නේ කවර හේතුවකට ද? ඔහු ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්‍ෂ මහතාට සාර්ථකව අභියෝග කළ අයකුවත් නො වේ. ඔහුට ජාතිකත්ව ඡන්දවලින් 8% පමණ ලබාගැනීමට හැකිවුව ද රනිල් සෝමහංස අවුල ඔහු ජයගන්නා තෙක් බලා සිටිය ද අම්බලන්ගොඩ ජනතාව ද ඇතුලු මෙරට සිංහල බෞද්ධයන්ගෙන් ඉතා විශාල බහුතරයක් ඔහු ප්‍රතික්ෂෙප කළහ. ඡන්ද දහඅටලක්‍ෂයකින් පැරදුණු අයකු අත්අඩංගුවට ගන්නේ අහවල් දෙයකට ද? හමුදා පොලීසිය හිටපු හමුදාපති ෆොන්සේකා අත්අඩංගුවට ගෙන ඇත. හිස් අවුල් කරගත් රනිල් සෝමහංස අවුල අත්අඩංගුවට ගෙන ඇත්තේ පැරදුණු අපේක්‍ෂකයා යැයි කියන්නේ ඒ බොරුව කියාවත් මහාමැතිවරණය ජයගැනීමට උත්සාහ කිරීමට ය. හමුදා පොලීසියට හිටපු හමුදාපති ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමට තිබුණේ ජනාධිපතිවරණය අවසන් වී දින දෙකකින් යැයි මම සිතමි. කෙසේ වෙතත් ඒ සඳහා හමුදා පොලිසියට තිබුණේ සුළු කාල පරිච්ඡෙදයකි. ඒ ජනාධිපතිවරණය අවසන්වීමත් මහාමැතිවරණයට නාම යෝජනා භාරගැනීමේ දිනයත් අතර කාල පරිච්ඡෙදයයි. මැතිවරණ සමයක දී අත්අඩංගුවට ගැනීම නීති විරෝධි නොවුණත් සිංහල බෞද්ධ සදාචාරයට විරුද්ධ ය. ඒ සදාචරත්වයේ නොවූ රනිල්ගේ මාමා බණ්ඩාරණායක මැතිණියගේ ප්‍රජා අයිතීන් නැති කෙළේ බටහිර නීතියට හා සදාචාරත්වයට එකඟව ය.  හිටපු හමුදාපති ෆොන්සේකා අත් අඩංගුවට ගැනීම වරද කර හයමාසයක් ඇතුළත සිදුවිය යුතුව තිබිණි. මේ සියල්ල සැලකීමේ දී ඔහු අත්අඩංගුවට ගැනීමට තිබුණේ මාසයක පමණ කාල පරිච්ඡෙදයක් බව පැහැදිලි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva